රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.05.24

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති
ප්‍රවෘත්ති කර්තෘ

## ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂිත විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නැවත ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙල පිළිබඳව මාධ්‍ය දැනුවත් කිරීම

අද දින (2020 මැයි 24) ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂිත විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් නැවත ගෙන්වා ගැනීමේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් වන මාධ්‍ය හමුවක් ගරු උසස් අධ්‍යාපන, තාක්ෂණ, නවෝත්පාදන හා තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමා, විදේශ සබඳතා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් කාන්දීපන් බාලසුබ්‍රමනියම් මහතා, විදේශ කටයුතු විදේශ සබඳතා අමාත්‍යාංශයේ ශ්‍රී ලාංකීය සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාකරන අන්සුල් ජාන් මහත්මිය, වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් රුවන්ති දැල්පිටිය මහත්මිය, විදේශ සේවා නියුක්ත කාර්යාංශයේ සාමාන්‍ය අධිකාරි වන්සේකර මහතා, විදේශ සේවා අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මංගල රන්දෙනිය යන මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

එහිදී දැක්වූ කරුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලාංකිකයින් ලක්ෂ 26 ක පිරිසක් විදෙස් ගතව සිටින බවත්, විදෙස් ශ්‍රමිකයන් ලෙස ඉන් ලක්ෂ 16ක ප්‍රමාණයක් සිටින බව
- මේ වන විට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා 41000ක ප්‍රමාණයක් ලියාපදිංචි වී සිටින බවත් ඔවුන් ලංකාවට ගෙන්වා ගැනීමේදී පහත සඳහන් නිර්නායකවල අනුපිළිවෙලට අනුව ප්‍රමුඛතාවය හිමි වන බව
    - I. ශිෂ්‍යයන්
    - II. එතෙර සිටින රාජ්‍ය සේවකයන්
    - III. කෙටි කාලීන වීසා මත රැඳී සිටින පිරිස්
    - IV. මානුෂික හේතුන් මත
    - V. රැකියා අහිමි වීම
- ශ්‍රී ලංකාවේ සිටින ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් විදෙස් රටවල සිට රැගෙන එන සියළුම පිරිස් නිරෝධායනයට ලක් කරන බව
- මෙලෙස නිරෝධානයට ලක්කරන බැවින් එකවර විදෙස් ගත පිරිස් ගෙන්වා ගැනීමට අපහසු බවත් එය ක්‍රමානුකූලව සිදුකරන බව
- තානාපති කාර්යාල මට්ටමින් විශේෂිත දුරකථන මාර්ග ඇති කර ඒ ඒ රටවල සිටින පුද්ගලයන්ගේ තොරතුරු ලබාගැනීම හා එහිදී හඳුනාගත් සෞඛ්‍ය පහසුකම්, කෑම බීම, නවාතැන් පිළිබඳ ගැටළු සඳහා විසඳුම් ලබා දීම.
- Contact Sri Lanka Web අඩවිය තුලින් මෙම පිරිස් සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය උපදෙස් ලබා දීම

- විදෙස් ගත ශ්‍රමිකයන්ට ලංකාවට මුදල් එවීමට නොහැකි නිසා ලංකාවේ සිටින ඔවුන්ගේ පවුල් සඳහා සහනාධාර ලබා දීමට රුපියල් මිලියන 50ක මුදලක් විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වෙන් කර ඇති බව
- විදෙස් රටවල සිටින ශ්‍රී ලාංකිකයින්ගේ රැකිය සුරක්ෂිත භාවය සම්බන්ධයෙන් විවිධ රජයන් සමග සකච්ඡා පවත්වමින් යන බව
- ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සමග මෙම වසංගතයේදී විදෙස් ගත ශ්‍රමිකයන්ට ලබා දිය හැකි රක්ෂණාවරන සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා පවත්වමින් සිටින බව.

මෙහිදී ඔවුන් දැක්වූ අදහස් ඇතුලත් වීඩියෝ පටය හා හඬ පටය පහත link එක ඔස්සේ ලබා ගත හැක.

https://www.vishmithacloud.com/s-WRfh9tYh